දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை
District Secretariat - Hambantota

පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට. 1ஆம் மாடி, றுஹுணு மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர, ஹம்பாந்தோட்டை. 1[st] Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota


"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"செளபாக்கியமான எதிர்காலத்திற்காக"
"For a prosperous future"

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No | DSH/DPS/5/DCC/Report/2026 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2026.10. 10 |

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2026.09.30</u>

2026.09.30 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යයන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතන වල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථා වලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය මා වෙත DCC Hambantota WhatsApp සමූහය වෙත හෝ dpshambantota@gmail.com වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව www.hambantota.dist.gov.lk දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබාගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.
දුරකථන /ෆැක්ස් :- 0472256234
විද්‍යුත් ලිපිනය :- dpshambantota@gmail.com

පිටපත් -

1.හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස.
2. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර මහාචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමා - කරු.දැ.ගැ.ස
3.ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
4.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය - දැ.ගැ.ස.

<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම</u>

**2026.09.30**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු සියලුම දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.09.30 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරින් ඇතුළු සියලු දෙනාම දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගැනීමෙන් අනතුරුව, ගරු සම සභාපතිතුමා විසින් පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සහා සම්මත කර න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | **2026.07.31 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.** | | | |
| 1.1 | ආලෝකපුර ඉඩම් ගැටළුව | වරාය අධිකාරියේ භුක්තිය යටතේ පවතින ඝන කැලෑවක් බවට පත් වූ මෙම භූමිය පිරිසිදු නොකිරීම සම්බන්ධව කමිටුවේ අවධානයට ලක්වූ අතර ඉක්මනින් පිරිසිදු කරන ලෙස දැනුම් දෙන ලදි. මේ සම්බන්ධව වරාය අධිකාරියේ ඉහල කළමනාකාරිත්වය දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදුකරන බව දැනුම් දෙන ලදි. | ලබන සඳුදා (2026.10.03) වන විට මෙම ඉඩම පිරිසිදු කිරීමට යොදා ගන්නා දිනය නිශ්චිතව දැනුම් දෙන ලෙසත් මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට පෙර මෙම කටයුත්ත අවසන් කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>සභාපති<br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය |
| 1.2 | ගොන්නෝරුව සිවරජගම ගම්මානයේ නිවාස 07 ක පදිංචිකරුවන් හට නිවාස හා ප්‍රවේශ මාර්ග අහිමිවීමේ අවදානමක් පැවතීම | මෙයට අදාළ නඩුව අවසන් වී ඇති බවත් මේ පිළිබඳ නීතිපති උපදෙස් ලබා ගැනීමට නියමිත බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව අදාළ ආයතන සමඟ විධිමත් සාකච්ඡාවක් සිදුකර, ගන්නා ලද තීරණ පිළිබඳ විධිමත් වාර්තාවක් මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ සියළුම පාර්ශ්ව වෙත උපදෙස් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>දිස්ත්‍රික් කළමනාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 1.3 | අනවසර හෝටල් ඉදිකිරීමක් හේතුවෙන් පොදු වෙරළ පරිසරයට හා ප්‍රදේශ වාසීන්ට හානි සිදුවීම | මෙම ඉදිකිරීම් සඳහා බලපත්‍ර ලබා දී ඇති බවත් තංගල්ල ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය ඉදිකිරීම් අනුමත කර ඇති බවත් දැනුම් දෙන ලදි. එහෙත් පසුව ඉදිකර ඇති තරප්පු පෙළ, පොල්ගස් සහ තහඩු ආවරණ අනවසර ඉදිකිරීම් නිසා ඒවා ඉවත් කිරීමට අදාළ තහනම් නියෝග සිදුකර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. තවද, මෙම ඉඩම විදේශ ජාතිකයෙකුට විකුණා ඇති බවත් ඔහු නැවත නොපැමිණීම නිසා මෙම ඉඩම හිමිව තිබූ පවුල්වල ඥාතීන් අතර ඉඩම් අයිතිය පිළිබඳ අර්බුධයක් පවතින බවට නිල නොවන මට්ටමින් වාර්තා වන බවත් දැනුම් දෙනලදි. | අදාළ ආයතන සම්බන්ධ වී සාකච්ඡාවක් සිදු කර විසඳුම් ලබාගන්නා ලෙසත් ඉඩමේ නිරවුල්භාවය පිළිබඳ වාර්තාවක් මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ගරු සභාපති ප්‍රාදේශීය සභාව තංගල්ල<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ අධිකාරිය |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.4 | උද්ධකන්දර ඉහළ ප්‍රදේශයේ පවතින නිවාස ව්‍යාපෘතියට ජලය නොමැති වීම | පානිය ජලය නොමැතිව, පවුල් 750 ඉක්මවා දුෂ්කරතාවයෙන් පසුවන බවත් මෙකී ගැටළුව සඳහා ජල සම්පාදන මණ්ඩලයට වසර 05ක් යන තෙක් විසඳුමක් ලබාදිය නොහැකි බව දැනුම් දෙන ලදී. එතෙක් ප්‍රජා ජල දෙපාර්තමේන්තුව මගින් ප්‍රජා ජල ව්‍යාපෘතියක් මගින් විසඳුම් ලබාදීමට හැකියාව පවතින බවත් මේ සඳහා යෝධ වැවෙන් ජලය ලබා ගැනීමට සිදුවන බවත් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය බවටත් සාකච්ඡා විය. දිස්ත්‍රික් මට්ටමින් මෙම එකඟතාව ලබාදිය නොහැකි බවත් වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලබාගත යුතු බවටත් දැනුම් දෙන ලදී. | යෝධ වැවෙන් ජලය ලබා ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලබා ගන්නා ලෙසත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ යටතේ ක්‍රියාත්මක කරන ලෙසටත් දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලෙක්ම හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br><br>ප්‍රාදේශීය කළමනාකරු ජලසම්පාදන හා ජලාපවාහන දෙපාර්තමේන්තුව<br><br>ස්ථානභාර නිලධාරී<br>ප්‍රජා ජල දෙපාර්තමේන්තුව |
| 1.5 | සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දි විදුලි කණු ඉවත් කිරීමේ දි විදුලිබල මණ්ඩලය විසින් ලබාදෙන ක්ෂේත්‍ර පරික්ෂණයේ දි අය කරන මුදල හා ඇස්තමේන්තුව සම්බන්ධ ගැටළු | සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විදුලි කණු ඉවත් කිරීමේ දී විදුලිබල මණ්ඩලය විසින් ලබාදෙන ක්ෂේත්‍ර පරික්ෂණයේ දී අය කරන මුදල හා ඇස්තමේන්තුව සම්බන්ධ ගැටළුව පොදුවේ දක්නට ලැබෙන තත්වයක් බවට කරුණු ඉදිරිපත් විය. | මෙය පොදු ප්‍රශ්නයක් බැවින් විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| 1.6 | නිවස ඉදිරිපස ළිඳක් කපා ගැනීමට ලබාදුන් අවසරය අවභාවිතා කිරීම | තිස්සමහාරාම, දෙබරවැව, ගැමුණුපුර පාර අංක 949 හි පදිංචි සඳුන් රංගන එදිරිසිංහ යන අය ළිඳක් මුවාවෙන් අවිධිමත් අනවසර හූ කැණීම් කටයුතු මේ වන විට නතර කර ඇති බවත් ඒ සඳහා අදාළ නිතිමය කටයුතු ක්‍රියාත්මක වන බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කළේ කෙසේද, වගකිව යුත්තන් කවුද යන බවට අභ්‍යන්තර පරික්ෂණයක් විමර්ශන අංශය හරහා සිදු කරන ලෙසත් මිලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වගකිව යුතු නිලධාරියෙක් කැඳවන ලෙස ද උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| 02. | **2026 වසරේ සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම.** | | | |

| ප්‍රා.ලේ.කො | ප්‍රජාශක්ති වැඩසටහන | | ග්‍රාමීය මාර්ග වැඩසටහන | | විමධ්‍යගත අයවැය වැඩසටහන | | නිල සෙවණ සේවා පියස | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා, රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| කටුවන | 57 | 83.434 | 19 | 57.3 | 19 | 5.10 | - | - | |
| වලස්මුල්ල | 50 | 72.498 | 15 | 57.3 | 12 | 4.20 | - | - | |
| වීරකැටිය | 63 | 76.248 | 15 | 58.1 | 17 | 5.30 | - | - | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| ඕකෙවෙල | 29 | 40.552 | 17 | 58.4 | 03 | 5.00 | - | - | |
| බෙලිඅත්ත | 69 | 89.747 | 15 | 57.3 | 10 | 7.40 | 05 | 11.75 | |
| තංගල්ල | 76 | 94.123 | 7 | 57.5 | 28 | 10.65 | 11 | 14.84 | |
| අඟුණුකොලපැ. | 53 | 73.172 | 10 | 58.3 | 13 | 5.75 | - | - | |
| අම්බලන්තොට | 55 | 86.288 | 15 | 57.4 | 14 | 7.00 | - | - | |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| හම්බන්තොට | 30 | 59.900 | 14 | 57.3 | 04 | 6.30 | - | - |
| සූරියවැව | 24 | 51.479 | 16 | 57.3 | 07 | 5.20 | - | - |
| තිස්සමහාරාම | 52 | 89.641 | 11 | 57.5 | 14 | 5.70 | - | - |
| ලුණුගම්වෙහෙර | 35 | 64.008 | 7 | 57.3 | 13 | 4.50 | - | - |
| **එකතුව** | **593** | **881.09** | **161** | **691.00** | **154** | **72.60** | **16** | **26.59** |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.1 | සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය | විමධ්‍යගත වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයට අනුමත වී ඇති රු.මි. 72.6ට අදාළ ව්‍යාපෘති 154 අතුරින් මේ වන විට ව්‍යාපෘති 40ක් අවසන් ව ඇති බවත් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ පළමු අදියරේ ව්‍යාපෘති 66 අතුරින් ව්‍යාපෘති 30ක් අවසන්ව ඇති බවත් දෙවන හා තෙවන අදියරේ ව්‍යාපෘති ඇස්තමේන්තු සකස් කරමින් ක්‍රියාත්මක කිරීමට සූදානම් වන බවත් දැනුම් දෙන ලදී. ප්‍රජා ශක්ති වැඩසටහන වෙනුවෙන් හඳුනාගෙන ඇති ව්‍යාපෘති 593 න් මේ වන විට ව්‍යාපෘති 16ක් පමණ අවසන් බවත් නිල සෙවණ වැඩසටහන ගැටළුවකින් තොරව සිදුවන බවත් දැනුම් දෙන ලදී.<br>විමධ්‍යගත වැඩසටහන යටතේ බෙලිඅත්ත කොට්ඨාසයේ ක්‍රියාත්මක වීමට නියමිත වායු රයිෆල් මිලදී ගැනීම සම්බන්ධව ගැටළුවක් පවතින බවට වාර්තා වන බව දැනුම් දෙන ලදී. වායු රයිෆල් මිලදී ගැනීමේ දි කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබාදෙන නිර්නායක යටතේ මිල ගණන් කැඳවා ඇති අතර එම මිල ගණන් වලට අදාළ වායු රයිෆල් වලට වඩා මිල අධික වායු රයිෆල් අවශ්‍ය බව ගොවි සංවිධාන පවසන බවත් ඒවා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් වගා හානි වෙනුවෙන් නිර්දේශ කරන රයිෆල් නොවන බවත් ඉන් පුද්ගල අනතුරු පවා සිදුවිය හැකි අවධානම් උපකරණයක් බවටත් සාකච්ඡා විය. එබැවින් ඒවා ලබා ගැනීම සඳහා නිර්දේශ කළ නොහැකි බවත් දන්වන ලදී. දිස්ත්‍රික් කෘෂිකර්ම අංශයෙන් ද වායු රයිෆල් මිල දී ගැනීමට කටයුතු සූදානම් කර පවතින බවත් ඒවාට කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති පිරිවිතරයන් භාවිතා කරන බවත් දන්වන ලදී.<br>තවද, අද දින එක් එක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් ඉදිරිපත් කරනු ලැබූ සංවර්ධන වැඩසටහන් වලට අදාළ සංශෝධන ආවරණ අනුමැතිය යටතේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් එම ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවත් දැනුම් දෙන ලදී. එමෙන්ම දිස්ත්‍රික් මාර්ග කමිටුවේ දී | වසර අවසන් වීමට පවතින්නේ මාස 03ක් පමණක් බවත් ව්‍යාපෘති ප්‍රගතිය අඩු මට්ටමක පවතින නිසා සියල්ලම එක් වී වැඩ අවසන් කර ගැනීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී.<br>පුද්ගලයන්ට හානි විය හැකි උපකරණ මිල දී ගැනීම අනුමත කළ නොහැකි බවත් දිස්ත්‍රික් කෘෂිකර්ම අංශයෙන් පිරිවිතර ලබාගෙන ඒ අනුව මිල ගණන් කැඳවා වායු රයිෆල් ලබා ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී.<br>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරු<br>ප්‍රාදේශිය ලේකම් බෙලිඅත්ත<br>දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරු |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | යෝජනා කළ පරිදි 2027 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක කිරිමට යෝජනා කරන ලද ව්‍යාපෘති ලේඛනය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ඉල්ලා සිටින ලදි. තවද, එම කමිටුවේ දී අලුත්වැඩියා කිරිම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ ග්‍රාමීය පාලම් ඒකකයට යොමු කළ පාලම් 02 සඳහා ද දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු අනුමැතිය අවශ්‍ය බව දැනුම් දෙන ලදි. | | |
| 03 | දකුණු පළාත් සභා සංවර්ධන වැඩසටහන යටතේ 2026 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය | | | |

| අමාත්‍යංශය | අනුමත ප්‍රතිපාදන මුදල රු.මි. | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. | වගකීම |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යංශය | 723.71 | 233 | 199 | 21 | 49.88 | ප්‍රධාන ලේකම් දකුණු පළාත<br>අමාත්‍යංශ ලේකම්වරුන් දකුණු පළාත් සභාව<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් දකුණු පළාත<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| කෘෂිකර්ම අමාත්‍යංශය | 400.72 | 160 | 125 | 35 | 100.07 | |
| ධීවර අමාත්‍යංශය | 237.25 | 82 | 72 | 10 | 70.60 | |
| ක්‍රීඩා අමාත්‍යංශය | 179.98 | 63 | 51 | 12 | 70.90 | |
| අධ්‍යාපන අමාත්‍යංශය | 460.04 | 61 | 40 | 21 | 45.18 | |
| **එකතුව** | **2001.70** | **599** | 500 | **99** | **336.62** | |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 04 | ප්‍රජා ශක්ති ජාතික වැඩසටහන සම්බන්ධව | ප්‍රජා ශක්ති වැඩසටහනට අදාළව සියළුම ව්‍යාපෘති මෙම වසරේ නොවැම්බර් 30 අවසන් කරන ලෙසත් දැනට ලබා දී තිබෙන ප්‍රතිපාදන රු.මි. 881.09 ට අමතරව රු.මි. 05ක් ලබා දිමට නියමිත බවටත් google Sheet යාවත් කාලින කිරිම නිවැරදිව සිදු කරන ලෙසත් යෝජනා විය. එමෙන්ම, තංගල්ල සුවහොජුන්හලට අදාළ ඇස්තමේන්තුව කඩිනමින් ලබාදෙන ලෙස ද හුංගම උස්සාන ජල ව්‍යාපෘතිය ලබන වසර තුළ දී ප්‍රමුඛත්වයක් දී සිදු කිරිමට කටයුතු කරන බවටද සාකච්ඡා විය. තවද, ලබන වසර සඳහා ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වන ව්‍යාපෘති කලින්ම හඳුනාගන්නා ලෙසත් ඒ සඳහා ග්‍රාම සංවර්ධන සැලසුම් යාවත්කාලින කිරිම හා ඒ අනුව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස ද දැනුම් දෙන ලදි.<br>හඳුනාගත් ව්‍යාපෘති සඳහා ජීවනෝපාය හා ආහාර සුරක්ෂිත බව ප්‍රමුඛතාව පදනම් කර ව්‍යපෘති අනුමත කළ බවත් අනුමත කරන | ව්‍යාපෘති කාරක ප්‍රාග්ධනය පිළිබඳ නැවත අමාත්‍යාංශය | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රජා සවිබල ගැන්වීමේ |



නිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ලැබූ ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති වාර්තා ලබා ගැනීමේ දී කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන් තිබෙන බවට නිරීක්ෂණය වූ අතර භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන නිකුත් කරනු ලබන්නේ ස්ථාවර ප්‍රාග්ධනය ලෙස බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගැනීම ප්‍රතිලාභීන් වෙනුවෙන් කාරක ප්‍රාග්ධනය සඳහා නැවත අයකර ගැනීමේ පදනම යටතේ කාරක ප්‍රාග්ධනය ලබාදීමට අමාත්‍යාංශය චක්‍රලේඛ නිකුත් කළ බවත් දැනුම් දෙන ලදී. | සමග සාකච්ඡා කර විසඳුමක් ලබාගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | අමාත්‍යාංශය |
| 05 | සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු. | දිස්ත්‍රික්කයේ ආරෝග්‍ය සුවතා මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු සිදු කරන බවටත් මේ දිනවල මහජන සෞඛ්‍ය භෙද නිලධාරීන් බැදිගම සහ සිටිනමළුව ප්‍රදේශවල නිවසින් නිවසට ගොස් තොරතුරු ලබා ගන්නා බැවින් ඒ පිළිබඳ ජනතාව දැනුවත් කරන ලෙස ද, එමෙන්ම ඩෙංගු අවධානම නැවත වර්ෂාවත් සමග වර්ධනය විය හැකි බැවින් පරිසරය පිරිසිදු කර ගැනීමේ කටයුතු ආරම්භ කරන ලෙස යෝජනා විය. එමෙන්ම වසර ගණනක් පැරණි ගිලන් රථ වෙනුවට නව ගිලන් රථ ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කරන ලදී. | ඩෙංගු අවධානම අවම කර ගැනීමට පරිසරය පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කරන ලෙසත් ගිලන් රථ ගැටළුව පිළිබඳ විමර්ශනයක් සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | අධ්‍යක්ෂ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා හම්බන්තොට |
| 06.1 | පාසල්වල සංවර්ධන කටයුතු සඳහා තාක්ෂණ නිලධාරින්ගේ සහාය ලබා ගැනීම | දිස්ත්‍රික් අධ්‍යාපන අනු කමිටුවේ දී ඉදිරිපත් වූ කරුණක් වන පාසල් සංවර්ධන කටයුතු මන්දගාමී වීමට හේතුව ලෙස තාක්ෂණික නිලධාරීන්ගේ සහාය අවම මට්ටමේ පැවතීම බවට කරුණු ඉදිරිපත් විය. | පළාත් පාලන ආයතන වල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින තාක්ෂණික නිලධාරීන්ගේ සහය තම ආයතන වල කටයුතු වලට ද බාධාවක් නොවන පරිදි පාසල් සංවර්ධන කටයුතු සඳහා ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>පළාත් පාලන සහකාර කොමසාරිස් |
| 06.2 | දිස්ත්‍රික්කයේ ඇතැම් පාසල් සඳහා පානීය ජල පහසුකම් නොමැතිවීම | දිස්ත්‍රික් අධ්‍යාපන අනු කමිටුවේ දී ඉදිරිපත් වූ කරුණක් වන ඇතැම් පාසල් සඳහා පානීය ජල පහසුකම් නොමැතිවීම බරපතල ගැටළුවක් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | කලාප මට්ටමින් පානීය ජල පහසුකම් නොමැති පාසල් නාම ලේඛනය ලබාගෙන ජල සම්පාදන කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය දකුණු පළාත<br><br>ප්‍රාදේශීය කළමනාකරු ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 07 | හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙදආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා | | | |
| 7.1 | 2015/2019 කාලයේදී වැඩ ආරම්භකරන ලද ග්‍රාමීය පාලම් 13 න් නැවත ඉදිකිරීම සිදු නොකරන ලද | මෙම ව්‍යාපෘතියට අදාලව වැඩ ආරම්භ නොකළ පාලම් 09න් 08ක වැඩ 2027 අප්‍රේල් මාසය වන විට ආරම්භ කිරීමට සැලසුම් සකස් කරමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය තංගල්ල |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | පාලම් 9 සම්බන්ධව | | | |
| 7.2 | වර්ෂ 1818 දී බ්‍රිතාන්‍යට එරෙහිව පැවති අරගලයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශප්‍රේමීන් ලෙස නම් නොකල ඉතිරි විරුවන් සම්බන්ධව, | මෙකී සටනට දායක වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ රණවිරුවන් ගෙන් දේශප්‍රේමීන් ලෙස ගැසට් පත්‍රිකාවට ඇතුළත් නොවූ ඉතිරි රණ විරුවන් දේශප්‍රේමීන් ලෙස නම් කිරීම සඳහා සාකච්ඡා වූ අතර එකී යෝජනාව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය සඳහා යොමු කළයුතු බවට ද කරුණු ඉදිරිපත් විය. | අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය සඳහා ඉතිරි රණ විරුවන් 17 දෙනාගේ නාමලේඛනය යොමු කරන ලෙසට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| 7.3 | 2020 /2025 වසරවල දී දිස්ත්‍රික්කය තුළ ආරම්භ කරන ලද ජල යෝජනා ක්‍රම 19 හි ප්‍රගතිය සාකච්ඡා කිරීම | සැමට ජලය වැඩසටහන යටතේ ජල සම්පාදන අමාත්‍යාංශය විසින් සකස් කර ඇති ප්‍රධාන සැලැස්මට අනුව ලුනුගම්වෙහෙර ජල සම්පාදන ක්‍රමයේ පැවති පැරණි ජල පිරිපහදුවේ ධාරිතා වර්ධනය සිදුකරන ලද බවත් ප්‍රමුඛතාවය මත ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු අදියරෙන් අදියර ඉතිරි ජලයෝජනා ක්‍රම සංවර්ධනය කිරීමට කටයුතු කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | ප්‍රමුඛතාවයන් හඳුනාගනිමින් ජල යෝජනා ක්‍රම සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය කළමනාකරු ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 08 | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 8.1 | ලුණුගම්වෙහෙරෙ නව නගරයේ භාවිතයට නොගන්නා නව බස් නැවතුම්පළ සම්බන්ධව | ලුනුගම්වෙහෙර නව නගරයේ පිහිටි දැනට භාවිතයට නොගන්නා නව බස් නැවතුම්පල මහජන ප්‍රයෝජනය සඳහා සුදුසු කාර්යයකට යොදා ගැනීමේ අරමුණින් ලුනුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව වෙත පවරාදීමට අදාලව නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව ප්‍රාදේශීය ලේකම් හරහා පැවරීමට කටයුතු සිදු කිරීම සුදුසු බවට යෝජනා විය. | මේ සම්බන්ධව විශේෂ සාකච්ඡාවක් සියලු පාර්ශ්වයන් ගෙන්වා සිදු කර වාර්තා කරන ලෙස උපදෙස් දෙන ලදී. | ගරු සභාපති ප්‍රාදේශීය සභාව ලුනුගම්වෙහෙර<br><br>ප්‍රාදේශීය ලේකම් ලුනුගම්වෙහෙර<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය<br><br>පළාත් පාලන ඉංජිනේරු<br><br>සභාපති මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 09 | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 09.1 | මීගස්ආර පශු වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටි ඉඩම සම්බන්ධව | මීගස්ආර පශු වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටි ඉඩම දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පැවරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පැවරුම් සහතිකයක් නිකුත් කර ඇති බවත් ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි මෙම ඉඩමෙන් පර්චස් 80ක් පමණ පශු වෛද්‍ය කාර්යාලය සඳහා වෙන්කර ඉතිරි ප්‍රමාණය සත්ත්ව අභිජනන මධ්‍යස්ථානයක්, කිරිහලක් හා සත්ත්ව ගොවිපලක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරන ලෙස කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණයක් කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br><br>ප්‍රාදේශීය ලේකම් වීරකැටිය |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 10 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | | | |
| 10.1 | 2026 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන සෞඛ්‍ය සැලැස්මට අදාළ සංශෝධන 05 ක් සඳහා අනුමැතිය ඉල්ලීම | 2026 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන සෞඛ්‍ය සැලැස්මට අදාළ සංශෝධන 05 ක් සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | ලේකම් ප්‍රධාන අමාත්‍යාංශය දකුණු පළාත |
| 10.2 | 2026 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ කෘෂිකර්ම අංශයට අදාළ සැලැස්මට එකතුවන නව ව්‍යාපෘති සඳහා අනුමැතිය ඉල්ලීම | 2026 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ කෘෂිකර්ම අංශයට අදාළ සැලැස්මට එකතුවන නව ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ හම්බන්තොට |
| 10.3 | වැටිය ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතියට ඉදිරිපත් කිරීම | වැටිය ක්‍රීඩා පිටිය ප්‍රදේශයේ ළමුන් සහ තරුණ පිරිස ක්‍රීඩා කටයුතු වල නිරන්තරයෙන් නිරත වන අතර මේ වන විට මෙම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බවත් මේ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය වෙතින් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍යව පවතින බවට කරුණු ඉදිරිපත් විය. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | සභාපති ප්‍රාදේශීය සභාව අම්බලන්තොට |
| 10.4 | දෙගල්දෙහෙර වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති යෝජනාව අනුමැතියට ඉදිරිපත් කිරීම | වියළි කලාපීය දිස්ත්‍රික්කවල සාම්ප්‍රදායික ජල කළමනාකරණ පිළිවෙත් හා පරිසර පද්ධති සහිතව සංරක්ෂණය යන ව්‍යාපෘතිය යටතේ දෙගල්දෙහෙර වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති යෝජනාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් හම්බන්තොට |
| 11 | සාකච්ඡා කරන ලද වෙනත් කරුණු හා පසුව ලැබුණු ලිපි | | | |
| 10.1 | තංගල්ල නගරයේ මළ අපද්‍රව්‍ය වැසි ජල කාණු පද්ධතියට මුදාහැරීම | ජනාධිපති ලේකම් කාර්යාලය වෙත තංගල්ල ප්‍රදේශවාසියෙක් විසින් තංගල්ල නගරයේ නිවාස වල මළ අපද්‍රව්‍ය පොදු වැසි ජල කාණු පද්ධතිය වෙත මුදා හරින බවට දැනුම් දී තිබෙන අතර දිස්ත්‍රික්කයට පොදු මළ අපද්‍රව්‍ය පද්ධතියක් කඩිනමින් සකස් කිරීමේ අවශ්‍යතාවය පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. ජාතික ජලසම්පාදන මණ්ඩලයේ 2021 වර්ෂයේ මේ සඳහා යෝජනා ඉදිරිපත් කළ බවත් අදාළ යෝජනා ඉඩමක් නොමැති බැවින් සිදු කිරීමට නොහැකි වූ බවත් දැනුම් දෙන ලදී. මේ වන විට ප්‍රාදේශීය සභා (තංගල්ල, බෙලිඅත්ත, වීරකැටිය, අඟුණුකොලපැලැස්ස) කිහිපයට අදාළ යෝජනා පවතින බවත් ඒවා ක්‍රියාත්මක කළ යුතු බවත් යෝජනා විය. | දිස්ත්‍රික්කය තුළ පොදු මළ අපවහන පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය බවටත් දැනට පවතින සැලැසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හරහා ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලා සිටින ලෙසත් උපදෙස් දෙන ලදී. | ගරු සභාපති ප්‍රාදේශීය සභාව තංගල්ල/ බෙලිඅත්ත/ වීරකැටිය/ අඟුණුකොලපැලැස්ස<br><br>ප්‍රාදේශීය කළමනාකරු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 10.2 | මුරුතවෙල ජාතික ජලසම්පාදන මණ්ඩලයේ පානීය | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් අමු ජලය පිරිපහදු කිරීමේ දී | මෙයට අදාළ කටයුතු කඩිනමින් සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය කළමනාකරු ජාතික ජල |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | ජල ව්‍යාපෘතියේ අප ජලය පිරිපහදු නොකර මුරුතවෙල (දකුණු ඇළ) ප්‍රධාන ඇළට මුදා හැරීම | බැහැර වන අපද්‍රව්‍ය සහ පිරිපහදු ක්‍රියාවලිය සඳහා යොදනු ලබන රසායනික ද්‍රව්‍ය සහිත සාන්ද්‍රණය වැඩි, කළු පැහැති අප ජලය මුරුතවෙල දකුණු ඇලට මුදාහරින බවටත් එමගින් සෞඛ්‍ය ගැටළු මතු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. එමෙන්ම විධිමත් අපජල පිරිපහදු පද්ධතියක් සකස් කර ස්වාභාවික පරිසර පද්ධතියට මුදා හැරීමට සුදුසු තත්ත්වයට පත් කරන ක්‍රියාවලිය සිදුකරන ලෙස යෝජනා විය. | | සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 10.3 | කුඩා බිබුල උතුර නල ළිං දෙක ප්‍රතිසංස්කරණය කිරීම | 2024 වර්ෂයේ මාතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් කුඩා බිබුල උතුර නල ළිං දෙක ඉදිකර තිබෙන බවත් මේ වන විට නළ ළිං වල රොන් මඩ සහ වැලි තැන්පත් වීම නිසා මෝටර් සවි කිරීමට නොහැකි වී ඇත. මේ හේතුවෙන් පවුල් 300ක් පමණ දැඩි අපහසුතාවයට පත් වී ඇති බැවින් මෙම ගැටළුව විසඳා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | මෙම ගැටළුව විසදීමට අවශ්‍ය කටයුතු ඉදිරි සතිය තුළ ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය කළමනාකරු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 10.4 | සූරියවැව ආයෝජන කලාපයට අයත් ප්‍රදේශය තුළ පවතින ටෙලිකොම් ආයතනයට අයත් මහල් ගොඩනැගිල්ල පිළිබඳ විමසීම | සූරියවැව ආයෝජන කලාපයට අයත් ප්‍රදේශය තුළ පවතින ටෙලිකොම් ආයතනයට අයත් මහල් ගොඩනැගිල්ල පිළිබඳ විමසීම සිදුකළ අතර එහිදි එම ගොඩනැගිල්ල ටෙලිකොම් ආයතනයට අයිති නොවන බවත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත අයිති බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) |
| 10.5 | රොටේ පාලම සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ඉල්ලීම | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තේනගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ රොටේ මාර්ගයේ පිහිටා ඇති රොටේ පාලම මේ වනවිට ඉතා අබලන් තත්වයට පත්ව තිබේ. මේ හේතුවෙන් මාර්ගයේ ගමන් ගන්නා ජනතාව දැඩි පීඩාවට මෙන්ම අනාරක්ෂිතභාවයට මුහුණ දී ඇති නිසා ඉතා කඩිනමින් සංවර්ධනය කළයුතු බවටත් මේ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය තංගල්ල |
| 10.6 | 2026 පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා අනුමැතිය ඉල්ලීම | 2026 පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉදිරිපත් කරන ලදී. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය දකුණු පළාත |
| 10.7 | හදිසි ප්‍රතිචාර ප්‍රතිපාදන යටතේ අධි අවධානම් ගස් ඉවත් කිරීම | කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සපුගහයාය ග්‍රාම නිලධාරි වසමේ ඉවත් කිරීමටහැකියාවක් නොමැති පුද්ගලික ඉඩමෙහි පිහිටි රිටි ගස ඉවත් කිරීම සඳහා රුපියල් තුන්ලක්ෂ විසිපන්දහසක මුදලක් | ඉඩම් හිමියාගේ ආර්ථික දුෂ්කරතා පිළිබඳව සහ ගස ඉවත් නොකිරීම සම්බන්ධව ඇති අවධානම පිළිබඳ ඇතුලත් වාර්තාවක් සකස් කරන ලෙස | ප්‍රාදේශීය ලේකම් කටුවන<br>නියෝජ්‍ය |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වැයවන බව දන්වා ඇති අතර එම ගස දැඩි අනතුරු දායක බැවින් හදිසි ආපදා ප්‍රතිචාර ප්‍රතිපාදන යටතේ ඉවත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. | උපදෙස් දෙන ලදී. ගස ඉවත් කිරීම සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය හම්බන්තොට. |
| 10.8 | ලුනුගම්වෙහෙර නව නගරය සඳහා ආරක්ෂිත රථ වාහන නැවැත්විය හැකි ස්ථානයක් සංවර්ධනය කිරීම | ලුනුගම්වෙහෙර නව නගරයේ අනාරක්ෂිතව නවතන රථ වාහන මගින් මාර්ග අනතුරු සිදුවීමේ හැකියාවක් පවතින බැවින් නව නගරය සඳහා ආරක්ෂිතව රථවාහන නැවැත්විය හැකි ස්ථානයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනාව සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් ලුනුගම්වෙහෙර |
| 10.9 | නවයාලවිල වැවේ රොන්මඩ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය | නවයාලවිල වැවේ රොන්මඩ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව පැහැදිලි කරන ලදී. | මේ සඳහා අවුරුදු දෙකක කාලයක් ගත වන බැවින් අවුරුද්දක් ඇතුළත මෙම කටයුතු අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය කළමනාකරු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 10.10 | කිරින්ද ධීවර වරායේ වැලි ගොඩ ගැසීම නිසා ධීවර යාත්‍රා තාවකාලිකව කිරින්ද නාවික හමුදා කඳවුර අසල පිහිටි ඔරුවැල්ල වරායේ නවතා තැබීමට අවසර ඉල්ලීම | මේ වන විට කිරින්ද ධීවර වරායේ වැලිගොඩ ගැසීම හේතුවෙන් ධීවර යාත්‍රා නවතා තැබීමේ අපහසුතාවක් පවතින බවත් එම නිසා මෙම ධීවර යාත්‍රා කිරින්ද නාවික හමුදා කඳවුර අසල පිහිටි ඔරුවැල්ල ධීවර වරායේ තාවකාලිකව නවතා තැබීමට අවසර ලබාදීම සුදුසු බවට යෝජනා විය.<br>තවද, කිරින්ද ඔරුවැල්ල වරාය නාවික හමුදා අධීක්ෂණය යටතේ පවතින බැවින් මේ සඳහා නාවික හමුදා මූලස්ථානයෙන් අවසර ලබාගත යුතු බවට කරුණු ඉදිරිපත් විය. | කිරින්ද නාවික කඳවුර අසල පිහිටි ඔරුවැල්ල වරාය තුල ධීවර යාත්‍රා නවතා තැබීමට අවශ්‍ය අවසර ලබා ගැනීමේ කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>සහකාර අධ්‍යක්ෂ ධීවර |

අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පළ කිරීමෙන් අනතුරුව සියළුම සංවර්ධන ව්‍යාපෘති 2026.11.30ට පෙර අවසන් කිරීම සඳහා උපරිම ධාරිතාවෙන් වැඩ කරන ලෙසත්, මීළඟ සම්බන්ධීකරණ කමිටුවට පෙර ඉදිරි සති දෙක ඇතුලත සාකච්ඡාවන් සිදුකර නිත්‍ය තීරණ ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. 2027 වසරට අදාළ සියලුම සංවර්ධන ව්‍යාපෘති පෙබරවාරි මැද භාගය වන විට ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, රට වෙනුවෙන් කැපවීමෙන්, උනන්දුවෙන් ක්‍රියාකලයුතු බවටත් වැඩිදුර අවධාරණය කරමින් පස්වරු 2.00 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා

බිමල් ඉන්දුජිත් ද සිල්වා දිස්ත්‍රික් ලේකම් / දිසාපති
දිස්ත්‍රික් ලේකම්/දිසාපති හම්බන්තොට
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2026 ඔක්තෝබර් මස ....09........................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.